# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1759/31 - 2012 මැයි 23 වැනි බදාදා - 2012.05.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 10 වැනි වගන්තිය යටතේ ප්‍රදානය කෙරෙන නිදහස් කිරීමේ නියෝගය**

**1. නිදහස් කිරීම් ප්‍රදානය කිරීම**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 10 (01) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව 469/1/1 ගාලු පාර, කොළඹ 03 ලියාපදිංචි ලිපිනයේ පිහිටා ඇති ටෝකියෝ සිමෙන්ට් (පවර්) ලංකා ලිමිටඩ් (මෙහි මින් මතුවට කොමිෂන් සභාව ලෙස හැඳින්වෙන) වෙත පහත දැක්වෙන කරුණු සඳහා බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමක් මෙයින් ලබා දේ.

මෙයට යා කොට 1 වැනි ඇමුණුමේ වැඩිදුරටත් විස්තර කර ඇති කොඩ් වේ, චීනවරාය, ත්‍රිකුණාමලයේ ටෝකියෝ සිමෙන්ට් (පවර්) ලංකා ලිමිටඩ් පරිශ්‍රය තුළ මෙම නියෝගයෙහි දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, විදුලිය උත්පාදනය කිරීමේ සීමිත කාර්යය සඳහා.

**2. අනුමැතිය**

නිදහස් කළ තැනැත්තා 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධානයන් ඇතුළත් ඊට පමණක් සීමා නොවූ විධිවිධානයන්ට යටත්ව විදුලිබලය උත්පාදනය සිදු කිරීම පිණිස අවශ්‍ය අදාළ නීති, රෙගුලාසි සහ රීති යටතේ අවශ්‍යය සියලු අනුමැතීන් ලබා ගත යුතු ය.

**3. නිදහස් කිරීමේ කාල සීමාව**

මෙයින් ලබා දෙන නිදහස් කිරීම 2011.05.21 දින බලාත්මක වන අතර අවලංගු හෝ ඉවත් කර ගැනීම නොකළහොත්, පහතින් දක්වා ඇති නිදහස් කිරීමේ නියෝගයේ අවලංගු කිරීමේ සහ ඉවත් කර ගැනීමේ විධිවිධානයන්ට යටත්ව, 2011.05.21 දින සිට වසර පහක (05) කාලයක් බලාත්මකව පවතිනු ඇත.

**4. නිදහස් කිරීම අවලංගු කිරීම හෝ ඉවත් කර ගැනීම**

මෙම නිදහස් කිරීම පනතේ 22 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීම හෝ ඉවත් කර ගැනීම සිදු කළ හැකි ය.

ආචාර්ය ජයතිස්ස ද කොස්තා,<br>
සභාපති,<br>
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව.

1A - G 016078 — 340 (2012/05)

***II කොටස නිදහස් කිරීමේ කොන්දේසි***

1 වැනි **කොන්දේසිය : අර්ථනිරූපනය සහ ගොඩනැගීම**

1. ප්‍රතිවිරුද්ධ අභිමථාර්ථයක් දිස් නොවේ නම්:

(අ) කොන්දේසිවල හෝ උපලේඛනවල භාවිතා කෙරෙන පාඨ සහ ප්‍රකාශන ඒවා නීති පැනවීමක සහ ඒවා හා අදාළ වන අර්ථකථන පනත්වල තිබෙන ආකාරයට අර්ථ දැක්වේ.

(ආ) නීති පැනවීමක් සඳහා වන පරිශීලනයන් සඳහා ප්‍රාථමික සහ ආනුෂාංගික නීති සම්පාදන ඇතුළත් වන අතර, මෙම අවස්ථා දෙකෙහිදීම, මෙම නීති සම්පාදනය බලාත්මක කෙරෙන දිනට පසුව සිදු කෙරෙන කිසියම් නවීකරණයක් හෝ ඒ සම්බන්ධයෙන් වන නැවත නීති පැනවීමක් ඇතුළත් වනු ඇත.

2. පනතේ කිසියම් විධිවිධානයක කාර්යයක් සඳහා පනතේ අර්ථ දක්වා ඇති කිසියම් පාඨයක් හෝ අර්ථ දැක්වීමක්, ප්‍රතිවිරුද්ධ අභිමථාර්ථයක් උද්ගත වුවහොත් හැර, කොන්දේසිවල හෝ උපලේඛනවල භාවිතා වන අර්ථයට සමාන අර්ථ දැක්වේ.

3. කොන්දේසි සහ උපලේඛනවල, විශේෂ කර දක්වා නොමැති නම් හෝ සංදර්භය මඟින් නියම කරනු ලබන්නේ නැතිනම් :

**"අනුබද්ධ"** නිදහස් කළ පුද්ගලයෙකු සම්බන්ධයෙන්, මෙහි අදහස වනුයේ නිදහස් කළ පුද්ගලයා අයත් සමාගම හෝ නිදහස් කළ පුද්ගලයාගේ කිසියම් අනුබද්ධ ආයතනයක් හෝ කිසියම් අයිති සමාගමක අනුබද්ධ ආයතනයක් මෙයින් අදහස් වන අතර, එම එක් එක් අවස්ථාවල එය 2007 අංක 7 දරන පනතේ අර්ථය තුළට ගැනේ;

**"අනුමත"** 4, සහ 20 වැනි කොන්දේසිවල කාර්යභාරය සඳහා මෙහි අර්ථය වනුයේ කොමිෂන් සභාව මඟින් අනුමත ඒවා වන අතර "අනුමත" යන්නෙහි අනුරූප අර්ථයක් පවතිනු ඇත.

**"බලපත්‍රලාභියා"** 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13 වන වගන්තිය යටතේ වලංගු බලපත්‍රයක් සහිත තැනැත්තෙකු.

**"නිදහස් කළ තැනැත්තා"** යනු පනතේ 10 වැනි වගන්තිය යටතේ විදුලිබලය බෙදාහැරීම සහ සැපයීම, හෝ බෙදාහැරීම හෝ සැපයීම සඳහා බලපත්‍ර ලබා ගැනීමෙන් නිදහස් කළ තැනැත්තෙකි;

**"විදුලිබල ව්‍යාපාරය"** යනු විදුලිබලය බෙදාහැරීමෙහි හෝ සැපයීමෙහි නිරතව සිටින කිසියම් තැනැත්තෙකි;

**"පරිපාලන සමාගම"** යනු 2007 අංක 7 දරන සමාගම් පනත තුළට අයත් පරිපාලන සමාගමකි;

**"නවීකරණය"** යන්නට එකතු කිරීම්, මඟහැරීම්, සංශෝධන සහ ආදේශ කිරීම් ඇතුළත් වන අතර ඊට සමාන ප්‍රකාශන ඒ අනුව අර්ථ දැක්වෙනු ඇත;

**"PUCSL පනත"** යනු 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත වේ;

**"ආශ්‍රිත සමාගම"** යනු 2007 අංක 7 දරන සමාගම් පනත තුළට ගැනෙන ආශ්‍රිත සමාගමකි;

**"කරුණු දැක්වීම"** යන්නට ලිඛිතව සිදු කරන කිසියම් විරෝධතාවයක් හෝ වෙනත් කිසියම් යෝජනාවක් ඇතුළත් වේ;

**"අනුබද්ධ ආයතනය"** යන්නෙහි 2007 අංක 7 දරන සමාගම් පනත තුළ දක්වා ඇති අර්ථය ඇත, **"අනුබද්ධ ආයතන"** ඒ අනුව අර්ථ දැක්වෙනු ඇත;

**"සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා"** යනු පනතේ 13(1)(ඇ)(i)(ආ) වගන්තිය යටතේ විදුලිබලය සම්ප්‍රේෂණය කිරීම සඳහා බලපත්‍රලාභියෙකි,

**"උත්පාදන ව්‍යාපාරය"** යනු බලපත්‍රලාභියාගේ සහ කිසියම් අනුබද්ධ ආයතනයක ආශ්‍රිත බලපත්‍රලාභී ව්‍යාපාරයක බලපත්‍ර සහිත ව්‍යාපාරයකි ;

**"බෙදාහැරීමේ බලපත්‍රලාභියා"** යනු පනතේ 13(1)(ඇ)(i)(ඇ) වගන්තිය යටතේ විදුලිබලය බෙදාහැරීමට හෝ සැපයීමට බලපත්‍රයක් සහිත තැනැත්තා වේ :

**"උත්පාදන බලපත්‍රලාභියා"** යනු පනතේ 13(1) (c) (i)(අ) වගන්තිය යටතේ ප්‍රදානය කර ඇති බලපත්‍රයකි ;

"**උත්පාදන බලාගාරය**" යනු විදුලිබලය උත්පාදනය හෝ ඒ ආශ්‍රිත කාර්යයක් සඳහා භාවිතා වන කිසියම් බලාගාරයක්, උපකරණයක්, මෙවලමක් හෝ උපාංගයක් වේ :

4. විශේෂ වශයෙන් විස්තර කර නොමැති නම්:

(අ) අනුපිළිවෙලින් අංකිත කොන්දේසියකට හෝ අංකිත උපලේඛනයකට වන කිසියම් මෙම නිදහස් කිරීමේ නියෝගයේ එම අංකය දරන කොන්දේසියට හෝ උපලේඛනයට අදාළ පරිශීලනයක් වේ;

(ආ) අංකිත උප වගන්තියකට වන කිසියම් පරිශීලනයක් එම පරිශීලනය පැන නගින උපලේඛනයේ එම අංකය සහිත උප වගන්තියට අදාළ පරිශීලනයක් වේ;

(ඇ) අංකිත ඡේදයක් සඳහා වන කිසියම් පරිශීලනයක් එම පරිශීලනය උද්ගත වන කොන්දේසියේ හෝ උප වගන්තියේ එම අංකය දරන ඡේදය සඳහා වන පරිශීලනයක් වේ; සහ

එවැනි විචලතාවයක්, අතිරේකයක් හෝ ප්‍රතිස්ථාපනයක් සහ කිසියම් ගිවිසුමක් සඳහා වන කිසියම් පරිශීලනයක් සීමා කරන කිසියම් විධිවිධානයකට අගතියක් නොමැතිව, නිදහස් කිරීමේ නියෝගය (මෙම නිදහස් කිරීමේ නියෝගය හැර), සාර සංග්‍රහය හෝ වෙනත් උපකරණයක් යන්නට එවැනි ගිවිසුමක්, නිදහස් කිරීමේ නියෝගයක්, සාර සංග්‍රහයක් හෝ වරින්වර වෙනස් කරන ලද, අතිරේකව සපයන ලද හෝ ප්‍රතිස්ථාපනය කරන ලද උපකරණයක් ඇතුළත් වේ.

5. කිසියම් කොටසක, කොන්දේසියක, උපලේඛනයක හෝ ඡේදයක ශීර්ෂ පාඨය හෝ මාතෘකාව එහි සම්ප්‍රයුක්තියට බලපෑමක් කරනු නොලබයි.

6. කිසියම් කාල සීමාවක් තුළ සිදු කළ යුතු බවට නිදහස් කිරීමේ නියෝගයක කිසියම් බැඳීමක් ප්‍රකාශ කෙරෙන අවස්ථාවක දී, එම නිදහස් කළ තැනැත්තා නියම කළ කාල සීමාව තුළ එම පොරොන්දුව ඉටු කිරීමට අපොහොසත් වුවහොත් එම කාල සීමාවෙන් පසුව එම පොරොන්දුව අඛණ්ඩව බන්ධනීය සහ බලාත්මක වේ. (නියමිත කාල සීමාව තුළ නිදහස් කළ පුද්ගලයාට එම කටයුතු ඉටු කිරීමට නොහැකි වීමේ හේතුව මත නිදහස් කළ පුද්ගලයා සම්බන්ධයෙන් ඇති සියලු හිමිකම් සහ ප්‍රතිකර්මවලට අගතියක් නොවී.)

7. මෙම නිදහස් කිරීමේ නියෝගය සහ පනත අතර කිසියම් අනනුකූලතාවයක් ඇත්නම්, එම අනනුකූලතාවයේ ප්‍රමාණයට පනත බලාත්මක වේ. පනතේ දක්වා ඇති කොන්දේසි මඟින් එහි දක්වා ඇති කොන්දේසිවලට අමතරව නිදහස් කිරීමේ නියෝගයේ සංඝටනීය කොටස් සකස් වේ.

**2 වැනි කොන්දේසිය : බලයලත් ව්‍යාපාරික කටයුතු**

1. උපලේඛනයෙන් හඳුනාගෙන ඇති උත්පාදන බලාගාර භාවිතා කරමින් කොමිෂන් සභාවේ අනුමැතියට සහ අදාළ අනුමැතිය ප්‍රදානය කිරීමේ දී කොමිෂන් සභාව විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව නිදහස් කළ තැනැත්තා උත්පාදන ව්‍යාපාරයේ නිරත විය යුතුය. එම ව්‍යාපාරික කටයුතුවලට –

   (අ) නිදහස් කළ තැනැත්තාගේ තිබෙන දක්ෂතාවයන් උපයෝගී කර ගත යුතුය ; සහ

   (ආ) උත්පාදන ව්‍යාපාරය සමග යෝග්‍ය හා සාමූහික විය යුතුය ;

2. මෙම කොන්දේසිය මගින් නිදහස් කළ තැනැත්තා පහත ආකාරයේ කිසියම් ව්‍යාපාරයක, හෝ ව්‍යාපාරික කටයුත්තක නිරත වීමෙන් වළකනු ලබන්නේ නැත.

   (අ) 1 වැනි ඡේදයට අනුකූලව කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ;

   (ආ) මෙම නිදහස් කිරීමේ නියෝගය බලාත්මක වන දිනට පෙර දින වන විටත් නිදහස් කළ තැනැත්තා විසින් සිදු කරමින් සිටීම

3. නිදහස් කළ තැනැත්තා විසින් ඉල්ලා සිටීමෙන් අනතුරුව, කොමිෂන් සභාව විසින්, නිදහස් කළ තැනැත්තා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන නියමයන් හා කොන්දේසිවලට යටත්ව කිසියම් කරුණකට අදාළ වූ කිසියම් සීමාවක් හා අදාළ වන මෙම කොන්දේසිය යටතේ එම බැඳීම්වලින් නිදහස් කරනු ඇත.

**3 වැනි කොන්දේසිය : කොමිෂන් සභාව වෙත තොරතුරු ලබා දීම**

1. නිදහස් කළ පුද්ගලයා විසින්, එම තොරතුරු කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කාල සීමාව තුළ නියම කරනු ලබන ආකාරයෙන් ලබා දිය යුතු අතර, කොන්දේසි අනුව හෝ පනත හෝ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පවත යටතේ කොමිෂන් සභාව වෙත නියම කර හෝ පවරා ඇති කාර්යයන් සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවන්හීදී එම වාර්තා ප්‍රසම්පාදනය කර ඉදිරිපත් කළ යුතුය.

2. 1 වන ඡේදයේ සාකල්‍යතාවයට අගතියක් නොවන ආකාරයෙන්, කොමිෂන් සභාව වෙත පිළියෙල කර සැපයිය යුතු ප්‍රමාණයට වඩා වැඩි, සහ වෙනස් ගිණුම් තොරතුරු ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව නියම කරනු ලැබිය හැක.

3. 1 වන ඡේදය යටතේ තොරතුරු ලබා දෙන ඉල්ලා සිටීම සඳහා වන කොමිෂන් සභාවේ බලය, මෙම නිදහස් කිරීමේ නියෝගයේ වෙනත් කිසියම් කොන්දේසියක් යටතේ හෝ අනුව හෝ, පනත, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත හෝ වෙනත් කිසියම් නීති සම්පාදනයක් යටතේ හෝ අනුව තොරතුරු ඉල්ලා සිටීමට ඇති බලයට අගතියක් සිදු නොවේ.

4. නිදහස් කිරීම ලබා ගෙන මාස එකක කාලයක් තුළ නිදහස් කළ තැනැත්තා උත්පාදන ව්‍යාපාරය සඳහා වගකිව යුතු පුද්ගලයෙකු එම සංවිධානය තුළ පත් කළ යුතු ය.

5. මෙම කොන්දේසිය තුළ:
"තොරතුරු" යන්නට කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන කිසියම් විස්තරාත්මක සහ ආකෘතියක පොත්, ලිපි ලේඛන, සටහන් ගිණුම්, ඇස්තමේන්තු, ප්‍රතිලබ්ධි හෝ වාර්තා (කොමිෂන් සභාවේ ඉල්ලීම අනුව විශේෂයෙන්ම පිළියෙල කරන ලද හෝ එසේ නොවන) ඇතුළත් වේ.

**4 වන කොන්දේසිය : කොමිෂන් සභාවේ තීරණ, නියෝග සහ පරිසමාප්තීන්**

1. නිදහස් කිරීමේ නියෝගය අනුව කොමිෂන් සභාව විසින් සාදන ලද ඕනෑම තීන්දු, නියෝග, විධාන සහ පරිසමාප්තීන්වලට නිදහස් කළ පුද්ගලයා අවනත විය යුතුය.

2. එම තීන්දු, නියෝග, විධාන සහ පරිසමාප්තීන් හා අනුකූල සාධාරණ ගාස්තු සඳහා නිදහස් කළ තැනැත්තා වගකිව යුතු ය.

3. කොමිෂන් සභාව විසින් සාදන ලද කිසියම් නියෝගයක් හෝ විධානයක් හා අනුකූල වීම සඳහා නිදහස් කළ තැනැත්තා විසින් කොමිෂන් සභාවට, වෙනත් කිසියම් බලධාරියෙකුට හෝ කොමිෂන් සභාවේ නියෝගය තුළ නිශ්චිතව දක්වනු ලබන තැනැත්තෙකු විසින් කොමිෂන් සභාවට අවශ්‍ය අවස්ථාවන්හිදී එහි දේපල වෙත පිවිසීමට සහ පාලනය කිරීමට ඉඩ ලබා දිය යුතු ය.

**5 වන කොන්දේසිය : තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවලට අනුකූල වීම**

1. කොමිෂන් සභාවේ ඉල්ලීමට අනුව, නිදහස් කළ තැනැත්තා කොමිෂන් සභාව විසින් සුදුසු බවට සලකනු ලබන කිසියම් විදුලිබල සමාගමක් විමසා කොමිෂන් සභාව විසින් වරින් වර නියම කරනු ලබන එවැනි තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ සංවර්ධනය කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු ය.

2. 1 වන ඡේදය අනුව සංවර්ධනය කරන ලද කිසියම් තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ ඒවා ක්‍රියාත්මක කිරීමට පෙර අනුමත කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. අදාළ සාර සංග්‍රහයේ දක්වා ඇති නවීකරණ ක්‍රියාවලිය අනුව කොමිෂන් සභාව වෙත සිය යෝජනා අදාළ අවස්ථාවේ දී දැනුම් දීම මගින් බලාත්මකව ඇති සාර සංග්‍රහයකට නවීකරණ යෝජනා ඉදිරිපත් කිරීමට නිදහස් කළ තැනැත්තාට පුළුවන.

4. මෙම කොන්දේසිය අනුව නිදහස් කළ තැනැත්තා විසින් සංවර්ධනය කර ක්‍රියාත්මක කරන ලද සියලු අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවල පිටපතක් නිදහස් කළ තැනැත්තා පහත අයවළුන් වෙත ලබා දීම හෝ යැවීම සිදු කළ යුතු ය.

   (අ) කොමිෂන් සභාව ; සහ

   (ආ) එය ඉල්ලා සිටින කිසියම් තැනැත්තෙකු වෙත.

5. නිදහස් කළ තැනැත්තා 4(ආ) ඡේදය අනුව ලබා දුන් හෝ යවන ලද පිටපතක් සඳහා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝගවල මෙම කොන්දේසිය සඳහා එම අවස්ථාව අනුව නිශ්චිතකර දක්වා ඇති මුදල නොඉක්මවන ගාස්තුවක් අය කළ හැකිය. නිදහස් කළ තැනැත්තා විසින් ඊට සුදුසු ලෙසට එහි නිශ්චිතව දක්වා ඇති ඕනෑම අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවල විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

6. අදාළ අවස්ථාවන්හි කොමිෂන් සභාව විසින් සුදුසු බවට සලකනු ලබන විදුලිබල සමාගම වෙතින් විමසා, නිදහස්කළ තැනැත්තා 6 වැනි ඡේදය යටතේ එම නියෝගවල නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ වලින් කොටසක් හෝ කොටස් සම්බන්ධයෙන් දක්වා ඇති එහි බැඳීම්වලින් නිදහස් කරමින් කොමිෂන් සභාව විසින් තීරණය කරන ලබන එම නියමයන් හා කොන්දේසිවලට යටත්ව කොමිෂන් සභාව විසින් නියෝග නිකුත් කරනු ඇත. කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ ලැබෙන තෙක්, නිදහස් කළ තැනැත්තා සියලු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දැනට තිබෙන තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහවලට අනුකූල විය යුතු ය.

**6 වන කොන්දේසිය : නිදහස් කිරීමේ නියෝගය නියම කිරීම සහ උත්පාදනය කිරීමේ ව්‍යාපාරයේ පැවරීම**

1. කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත එකඟතාව නොමැතිව, නිදහස් කළ තැනැත්තා මෙම නිදහස් කිරීමේ නියෝගය සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් පැවරීම නොකළ යුතු ය.

2. කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත එකඟතාවයක් නොමැතිව මෙම නිදහස් කිරීමේ නියෝගය යටතේ සිදු කර ගෙන යන උත්පාදනය කිරීමේ ව්‍යාපාරය සම්පූර්ණ වශයෙන්ම හෝ එහි කොටසක් වෙනත් පුද්ගලයෙකුට ("පැවරුම්ලාභියා") පැවරීමට, නිදහස් කළ පුද්ගලයා කටයුතු නොකළ යුතු ය.

3. මෙම නිදහස් කිරීමේ නියෝගයේ කිසියම් නියම කිරීමක් සඳහා හෝ උත්පාදනය කිරීමේ ව්‍යාපාරයේ පැවරීම සඳහා වන කොමිෂන් සභාවේ කිසියම් එකඟතාව අදාළ වන පරිදි, පැවරුම්කරු හෝ පැවරුම්ලාභියා සතුව මෙම නිදහස් කිරීමේ නියෝගයේ කොන්දේසිවලට අනුකූල වීම සඳහා වන තාක්ෂණික හා මූල්‍ය ශක්‍යතාවය තිබෙන බවට කොමිෂන් සභාවේ සෑහීමට පත් වීමට යටත් වන අතර, පැවරීමක් සම්බන්ධයෙන් පමණක් වන විට, පැවරුම්ලාභියා වෙත නිදහස් කිරීමේ නියෝගයක් ලබා දීමේ දී, අදාළ ආකාරය අනුව පැවරුම්කරු හෝ පැවරුම්ලාභියා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන විට පනත අනුව මෙම නිදහස් කිරීමේ නියෝගය වෙනස් කිරීම ද ඇතුළුව, කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි තීරණය කරනු ලබන වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අනුකූල වීමට යටත් වේ.

4. මෙම කොන්දේසියේ කිසිවක් මගින් නිදහස් කළ තැනැත්තා උත්පාදන ව්‍යාපාරය පැවරීම සඳහා කොමිෂන් සභාව එකඟතාවය ලබා දී ඇති පැවරුම්ලාභියෙකුට පැවරීමෙන් වළක්වාලන විධිවිධානයක් නොමැත, එසේ වුව ද කිසියම් පැවරීමක් සඳහා එකඟතාව ලබා දුන් පසුව ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මන් අවස්ථාවක එම පැවරීම ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ.

**7 වන කොන්දේසිය : නිදහස් කිරීමේ නියෝගය අවලංගු කිරීම හෝ ඉවත් කර ගැනීම**

1. පහත දැක්වෙන අවස්ථාවන්හි දී 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 22 වන වගන්තිය යටතේ කොමිෂන් සභාවට නිදහස් කිරීමේ නියෝගය අවලංගු කළ හැකිය :

   (අ) නිදහස් කළ තැනැත්තා මෙම නිදහස් කිරීමේ නියෝගය අවලංගු කළ යුතු බවට ලිඛිතව එකඟ වේ නම් ;

   (ආ) මෙම නියෝගයේ හෝ විධානයේ 2 වන කොන්දේසිය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන නියෝගයක් හෝ විධානයක් හා අනුකූල වීමට එය නිකුත් කළ දින සිට දින 60ක් තුළ හෝ එම නියෝගයේ හෝ විධානයේ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන කාල සීමාවක් තුළ නිදහස් කළ තැනැත්තා අසමත් වේ නම් ;

   (ඇ) පහත අවස්ථාවන්හි දී:

      (1) නිදහස් කළ තැනැත්තාගේ පාලනය සම්බන්ධයෙන් වෙනස්වීමක් සිදු වුවහොත් ; සහ

      (2) නිදහස් කළ තැනැත්තා තුළ උත්පාදන ව්‍යාපාරය සිදු කර ගෙන යාම සඳහා ඇති එහි පාර්ශ්වකරණයේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන නව පාර්ශ්වකරුවා හෝ නව පාර්ශ්වකරුවා (සිටී නම්) විසින් පත් කරනු ලබන අස්ථිත්වය සතුව බෙදාහැරීමේ ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් තාක්ෂණික, මූල්‍ය හෝ කළමනාකරණ ශක්තියක් නොමැති බවට කොමිෂන් සභාව සෑහීමට පත් වුවහොත් ; සහ

      (3) නිදහස් කළ තැනැත්තාගේ පාලනයේ වැඩිදුර වෙනස්වීමක් නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට නිවේදනය ලබා දුන් දින සිට ආරම්භ වී මාස තුනක කාලයක් තුළ සිදු වුවහොත් කොමිෂන් සභාව මෙම ඡේදය අනුව මෙම නියෝගය අවලංගු කිරීමට අදහස් කරන බව ප්‍රකාශ කරමින් කොමිෂන් සභාව නිදහස් කළ තැනැත්තා වෙත දැනුම් දීමක් කරන්නේ නම් ; සහ

      (4) එම කාලය තුළ වැඩිදුර වෙනස් වීම් සිදු නොවුවහොත් ;

   (ඈ) නිදහස් කළ තැනැත්තාගේ පාලනයේ වෙනස්වීමක් ඇති වී සෑහෙන සාධාරණ කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම් දීමට නිදහස් කළ තැනැත්තා අසමත් වුවහොත් ;

   (ඉ) කොමිෂන් සභාව විසින් සිය අභිමතය පරිදි සියලුම අවස්ථාවන්හි දී සාධාරණ යයි සලකනු ලබන ඊට වඩා කිසියම් දිගුකාලයක් ලබා දිය හැකි නිදහස් කළ තැනැත්තාගේ සාධාරණ පාලනයෙන් බැහැර බවට කොමිෂන් සභාවට සෑහීමට පත් විය හැකි, හේතුවක ප්‍රතිඵලයක් ලෙස උත්පාදන ව්‍යාපාරය මාස තුනක අඛණ්ඩ කාලයක් තුළ ක්‍රියාත්මක කිරීම නිදහස් කළ තැනැත්තා විසින් නැවතුවහොත් ;

   (ඊ) මෙම නිදහස් කිරීමේ නියෝගය නිකුත් කිරීම සඳහා පදනම් වී ඇත්තේ නිදහස් කළ තැනැත්තා විසින් සැලකිය යුතු තරම් සාවද්‍ය හෝ වැරදි තොරතුරු බවට සොයා ගැණුනහොත්.

8 වන කොන්දේසිය : පරිසරය

1. අනුකූල විය යුතු පාරිසරික නීති යටතේ නිදහස් කළ තැනැත්තා වෙත ලබා දිය හැකි කිසියම් නිදහස් කිරීම් හෝ සහන කාලයන්ට යටත්ව, ශ්‍රී ලංකාවේ සියලු අදාළ පාරිසරික නීති රීතිවලට අනුකූල විය යුතු ය.

2. නිදහස් කළ තැනැත්තා විසින්, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන දිනයට පසු නොවන දිනයක කොමිෂන් සභාව විමසා, අදාළ සියලු පාරිසරික නීති යටතේ වන එහි කාර්යයන් සහ බැඳීම් සමග අනුකූල වීමට නිදහස් කළ තැනැත්තා අදහස් කරන ආකාරය නිශ්චිතව දක්වමින් ලිඛිත ප්‍රතිපත්තියක් සකස් කිරීමට, සහ වරින් වර වෙනස් කිරීමට කටයුතු කළ යුතු ය.

3. කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන ආකාරයට සහ කාල සීමාවන්හි සිය පාරිසරික කාර්යසාධනය පිළිබඳව නිදහස් කළ තැනැත්තා කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතු ය.

4. මෙම නිදහස් කළ නියෝගයේ අරමුණු සඳහා, "පාරිසරික නීති" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරිසරය මත යැපෙන මිනිසුන්ගේ සෞඛ්‍යය, ශාක, සතුන් සහ පරිසර පද්ධති ද ඇතුළුව පරිසරයේ ආරක්ෂාව සඳහා, වරින් වර බලාත්මකව පවතින නීති වේ, සැකය මගහරවා ගැනීම සඳහා ඊට 1980 අංක 47 දරන ජාතික පරිසර පනත ඇතුළුව නමුත් එහෙත් ඊට සීමා නොවී පාරිසරික බලපෑම් ඇගයීම හා වායුගෝලය, ඉඩම් හා ජලය ආරක්ෂා කිරීම හා සම්බන්ධ සියලු අදාළ නීති සම්පාදන ඇතුළත් වේ.

9 වන කොන්දේසිය : සෞඛ්‍යය හා ආරක්ෂාව

1. පහත 2 ඡේදයෙහි දක්වා ඇති ආරක්ෂණ සහ තාක්ෂණික සැලැස්මක් පිළියෙල කිරීම ඇතුළුව, බෙදාහැරීමේ ව්‍යාපාරය සිදු කර ගෙන යාමේ දී නිදහස් කළ තැනැත්තා අතින් පුද්ගලයින්ට, යන්ත්‍රවලට, උපකරණවලට සහ දේපළවලට සිදු වීමට ඉඩ ඇති තුවාල සහ හානිවලින් ආරක්ෂා කිරීමට නිදහස් කළ තැනැත්තා සියලු සාධාරණ පියවර ගත යුතු ය.

2. නිදහස් කළ තැනැත්තා විසින් :

   (1) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන දිනයකට පසු නොවන දිනයක කොමිෂන් සභාව විමසා බලා, ආරක්ෂක තාක්ෂණික කළමනාකරණ සැලැස්මක් පිළියෙල කොට අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය ;

   (2) සැලැස්මේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සහතික කිරීමට වාර්ෂිකව සමාලෝචනය කර, අවශ්‍ය වුවහොත් යාවත්කාල කර, එසේ යාවත්කාල කළ සැලැස්ම අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය ;

   (3) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරිදි සැලැස්ම (කලින් කලට යාවත්කාල කර) හා අනුකූල විය යුතු ය;

   (4) කොමිෂන් සභාවේ අනුමැතියක් නොමැතිව සැලැස්ම සංශෝධනය නොකළ යුතු ය ; සහ

   (5) සැලැස්ම යටතේ එහි බැඳීම් හා එහි අනුකූලත්වය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සහ සැලැස්මට අනුකූලව ස්වාධීන විශේෂඥයකු ලවා වාර්ෂික විගණනයක් සිදු කෙරෙන බවට වග බලා ගැනීම ;

   (6) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇති සෞඛ්‍ය හා ආරක්ෂණ සංඛ්‍යාලේඛන සහ දර්ශක සංගෘහිත කිරීම ; සහ

   (7) එම විගණන, සංඛ්‍යාලේඛන සහ දර්ශකවල ප්‍රතිඵල ඉක්මණින් කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම.

10 වන කොන්දේසිය : රක්ෂණය

1. නිදහස් කළ තැනැත්තා බෙදාහැරීමේ ව්‍යාපාරය හා සම්බන්ධ අවදානම් කළමනාකරණය හා රක්ෂණය හා අදාළ සාධාරණ සහ දූරදර්ශී ප්‍රතිපත්ති අනුගමනය කර ක්‍රියාත්මක කරනු ඇත.

11 වන කොන්දේසිය : සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට තොරතුරු සැපයීම

1. නිදහස් කළ තැනැත්තා විසින්, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා වෙත සිය අනාගත විදුලිබල හා බලශක්ති උත්පාදන පිළිබඳ පුරෝකථනය කිරීමට ප්‍රමාණවත් වාර්තා පවත්වාගත යුතු ය :

12 වන කොන්දේසිය : විදුලිය මිලට ගැනීමේ ගිවිසුම (ම්)

1. නිදහස් කළ තැනැත්තා විසින් සිය උත්පාදනයෙන් 50%ක විදුලි උත්පාදනයක් පමණක් සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා සමග පවතින සම්මත විදුලිය මිලට ගැනීමේ ගිවිසුම යටතේ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා වෙත ලබා දේ ;

2. නිදහස් කළ තැනැත්තා සහ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා අතර සම්මත විදුලිය මිලට ගැනීමේ ගිවිසුම් අදාල රෙගුලාසි අනුව කොමිෂන් සභාව විසින් බලාත්මක කරනු ලැබේ.

3. විදුලිබලය සහ උපකාරක සේවා සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා වෙත කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අයකුම ගාස්තු මත පදනම්ව අලෙවි කිරීම සඳහා කොමිෂන් සභාව විසින් නිදහස් කළ තැනැත්තාට අවසර ලබා දෙනු ඇත.

4. කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන නිශ්චිත කාලයක් සඳහා 3 වන ඡේදය යටතේ අවසර ලබා දෙනු ඇත.

13 වන කොන්දේසිය : රහස්‍ය තොරතුරු

1. උත්පාදන ව්‍යාපාරය පිළිබඳව තමා වෙත ලැබෙන සියලු තොරතුරු සම්බන්ධයෙන් පහත දැ කිරීම සඳහා නිදහස් කළ තැනැත්තා වග බලා ගත යුතු ය :

   (1) කොමිෂන් සභාව විසින් එසේ නොකිරීමට අවසර දී ඇති අවස්ථාවල දී හැර, නිදහස් කළ තැනැත්තා විසින් රහස්‍ය ලෙස තබා ගන්නා බවටත්, මෙම නිදහස් කිරීමේ නියෝගය හෝ වෙනත් පරිචය සංග්‍රහයක් සහ එම රහස්‍ය තොරතුරු වෙත ලබා දෙනුයේ ඒවායේ නිසි නීත්‍යානුකූල කාර්යයන් සිදු කිරීම සඳහා, නිදහස් කළ තැනැත්තාගේ අධ්‍යක්ෂවරුන්ට, නිලධාරින්ට සහ සේවකයින්ට පමණක් බවටත්, එසේ නැතහොත් මෙම රහස්‍යතා අවශ්‍යතාව පිළිපැදීමට ලිඛිතව එකඟ වී සිටින නිදහස් කළ තැනැත්තන්ගේ නියෝජිතයින්ට පමණක් බවටත් ;

   (2) එම තොරතුරු ලබා දුන් අරමුණ හෝ මෙම නිදහස් කිරීමේ නියෝගයේ හෝ පරිචය සංග්‍රහයේ අවසර දී ඇති අරමුණක් සඳහා හැර වෙනත් අරමුණක් සඳහා නිදහස් කළ තැනැත්තා විසින් භාවිතා නොකරන බවට ; සහ

   (3) උත්පාදන ව්‍යාපාරයේ සමන්විත වන සේවාවක් නොවන සේවාවක් සැපයීමේ දී කිසියම් වාණිජ වාසියක් සඳහා නිදහස් කළ තැනැත්තා විසින් භාවිතා නොකරන බවට.

14 වන කොන්දේසිය : ආරවුල් විසඳීම

1. නිදහස් කළ තැනැත්තා විසින් :

   (අ) තමා සහ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා අතර වන විසඳීමට නොහැකි අර්බුදයක් - ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද නීති අනුව සමථකරණය සහ විසඳීම සඳහා අර්බුදය කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු ය ;

   (ආ) අර්බුදයක් (1(අ) ඡේදයෙන් විමර්ශනයට ලක් කරන ලද අර්බුදය නොවන වෙනත් අර්බුදයක්) - ශ්‍රී ලංකා මහජන උපයෝගීතා පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද නීති අනුව, එම නීතිය අනුව අර්බුදය විසඳීමට හෝ, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන අවස්ථාවක අර්බුදය උසාවියක් හෝ බේරුම්කරණ මණ්ඩලයක් වෙතයොමු කිරීමට එම අර්බුදය කොමිෂන් සභාව වෙත යොමු කෙරේ.

***III කොටස උත්පාදනය සඳහා වන නිශ්චිත කොන්දේසි :***

1. විදුලිය සැපයීම සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන්ගේ හෝ බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ ජාලයේ විදුලි රෝදය කැරකීමට හේතු නොවේ ;

2. බෙදාහැරීමේ බලපත්‍රලකරුවන්ගේ හෝ සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන්ගේ ජාල වෙත සැපයෙන බලශක්තිය හඳුනාගත් උත්පාදන බලාගාරය මගින් උත්පාදනය කෙරෙන බලශක්තියෙන් සියයට පනහකට වඩා වැඩි නොවිය යුතු ය ;

3. එම පරිශ්‍රය තුළම පිහිටා ඇති ආශ්‍රිත ව්‍යාපාරයන් වෙත විදුලිය නොසැපයිය යුතු ය ;

4. බලපත්‍ර ලබා දී හෝ නිදහස් කර ඇති අනෙකුත් කිසියම් විදුලි බලාගාරවලින් මෙම බලාගාර වෙන්ව පැවතිය යුතු ය.

06-340

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.